හැටන් - නුවරඑළිය මාර්ගය වැඩිදියුණු කිරීමේ ව්‍යාපෘතිය - 2014

------------------------------------------------------------------------

හැටන් - නුවරඑළිය මාර්ගය වැඩිදියුණු කිරීමේ ව්‍යාපෘතියේ 2014 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය හා ආර්ථික සංවර්ධන සහයෝගීතා අරමුදල අතර 2010 නොවැම්බර් 02 දින එළඹි අංක එස්ආර්අයි - 20 දරන ණය ගිවිසුම සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (1) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී.

1.2 ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම, අරමුණු, අරමුදල් යෙදවීම හා ව්‍යාපෘති කාලය

-----------------------------------------------------------------------------

ව්‍යාපෘතියේ ණය ගිවිසුම අනුව, මහාමාර්ග හා ආයෝජන ප්‍රවර්ධන අමාත්‍යාංශය ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරවීමේ නියෝජිතායතනය වන අතර මාර්ග සංවර්ධන අධිකාරිය ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමේ නියෝජිතායතනය වේ. හැටන් සිට නුවරඑළිය දිස්ත්‍රික්කය සඳහා වෙළඳපොළවලට ප්‍රවේශය හා රැකියා අවස්ථා සහ සමාජ සේවා සැපයීම වැඩිදියුණු කිරීම මඟින් සමාජ ආර්ථික වර්ධනය ප්‍රබෝධමත් කරලීම හා දකුණු පළාතේ ඉතිරි සංවර්ධනය ව්‍යාපෘතියේ අරමුණුවේ. එබැවින් හැටන් සිට නුවරඑළිය මාර්ගයේ කිලෝමීටර් 35.6 ක් වැඩිදියුණු කිරීම, කොටගල උමං මාර්ගය හා නුවරඑළිය යටින් දිවෙන දුම්රිය මාර්ග පාලම ඉදිකිරීම යෝජනා කර තිබුණි. ණය ගිවිසුම අනුව, ව්‍යාපෘතියේ ඇස්තමේන්තුගත මුළු පිරිවැය රු.මිලියන 5,618 කට සමාන එජඩො මිලියන 49.92 ක් වූ අතර, ඉන් රු.මිලියන 4,501.2 කට සමාන එජඩො මිලියන 40 ක් සැපයීමට ආර්ථික සංවර්ධන සහයෝගීතා අරමුදල එකඟ වී තිබුණි. ව්‍යාපෘතිය එහි කටයුතු 2011 දෙසැම්බර් 01 දින ආරම්භ කරන ලද අතර 2015 දෙසැම්බර් 31 වන විට නිමකිරීමට නියමිතය.

1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම

-----------------------------------------------------------------

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

1.4 විගණකගේ වගකීම

--------------------

මාගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මා විසින් ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව මාගේ විගණනය සිදු කරන ලදී. ආචාරධර්මවල අවශ්‍යතාවන්ට මම අනුකූලවන බවට සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබාගැනීම පිණිස විගණනය සැලසුම් කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි. මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම්වලට උපකාරී වන විගණන සාක්ෂි ලබාගැනීම පිණිස පරිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුළත් වේ. තෝරාගත් පරිපාටීන්,වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගේ අවදානම් තක්සේරු කිරීම්ද ඇතුළත් විගණකගේ විනිශ්චය මත පදනම් වේ. එම

අවදානම් තක්සේරු කිරීම්වලදී, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස ව්‍යාපෘතියේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාළ වන්නා වූ අභ්‍යන්තර පාලනය විගණක සැලකිල්ලට ගන්නා නමුත් ව්‍යාපෘතියේ අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි. කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය හා යොදාගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගයීම මෙන්ම මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගයීමද විගණනයට ඇතුළත් වේ.
මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි. පහත සඳහන් දෑ තක්සේරු කිරීමෙහිලා අවශ්‍ය යැයි සලකනු ලැබූ එවැනි පරීක්ෂා කිරීම්ද එම පරීක්ෂණයට ඇතුළත් විය.

(අ) අභ්‍යන්තර පාලන අංශයෙන් බලන කල ව්‍යාපෘති කළමනාකරණය පිළිබඳ සතුටුදායක පාලනයක් සහ ව්‍යාපෘතියේ මෙහෙයුම්වලට අදාළ පොත්පත්, වාර්තා ආදියේ විශ්වාසවන්තභාවය තහවුරු වනු පිණිස පද්ධති සහ පාලන ප්‍රමාණවත් වූයේද යන බව.

(ආ) ව්‍යාපෘතියේ මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන වියදම ව්‍යාපෘතිය විසින් පවත්වා ගෙන යන ලද වැඩිදියුණු කළ මූල්‍ය වාර්තා හා ප්‍රගති වාර්තා සමඟ සතුටුදායක ලෙස සසඳා තිබුණේද යන බව,

(ඇ) ශ්‍රී ලංකා රජය හා ණය සපයනු ලබන නියෝජිතායතනය විසින් සපයන ලද අරමුදල්වලින් දරන ලද ව්‍යාපෘති වියදම්, මූල්‍ය හා භෞතික වශයෙන් ව්‍යාපෘතියේ ප්‍රගතිය, ව්‍යාපෘතියේ මෙහෙයුම් කටයුතුවලින් උද්ගත වූ වත්කම් සහ වගකීම්, ණයවලින් කරන ලද මිලදී ගැනීම් ආදිය දැක්වෙන පරිදි අඛණ්ඩ පදනමක් මත ප්‍රමාණවත් ගිණුම් වාර්තා පවත්වා ගනු ලැබුවේද යන බව.

(ඈ) ණය යටතේ ආපසු ගැනීම් ණය ගිවිසුමේ දක්වා ඇති පිරිවිතරයන්ට අනුකූලව සිදුකර තිබුණේද යන බව.

(ඉ) ණය යටතේ සපයන ලද අරමුදල්, ද්‍රව්‍ය හා උපකරණ ව්‍යාපෘතියේ අරමුණු සඳහා උපයෝජනය කර තිබුණේද යන බව.

(ඊ) ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම සඳහා අනුගමනය කරන ලද වර්ගීකරණයට අනුව වියදම නිවැරදිව හඳුනාගෙන තිබුණේද යන බව.

(උ) ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිති පදනම් කරගෙන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර තිබුණේද යන බව.

(ඌ) මාගේ පෙර වර්ෂයේ විගණන වාර්තාවෙන් පෙන්වා දෙන ලද කරුණු නිවැරදි කර ගැනීම සඳහා කළමනාකරණය විසින් සතුටුදායක ක්‍රියාමාර්ග ගෙන තිබුණේද යන බව සහ,

(එ) ණය ගිවිසුමේ දක්වා ඇති මූල්‍ය සම්මුතීන්වලට අනුකූල වූයේද යන බව.

2. මූල්‍ය ප්‍රකාශන

----------------

2.1 මතය

--------

මාගේ පරීක්ෂණයෙන් පෙනී යන අන්දමට සහ මට සපයන ලද උපරිම තොරතුරු සහ පැහැදිලි කිරීම් අනුව, මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දැක්වෙන කරුණුවලින් උද්ගත වන ගැලපීම්වලින් ඇතිවන බලපෑම හැර මා දරන්නාවූ මතය වනුයේ,

(අ) 2014 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ව්‍යාපෘතිය නිසි ගිණුම් වාර්තා පවත්වා ඇති බව හා 2014 දෙසැම්බර් 31 දිනට ව්‍යාපෘතියේ ක්‍රියාකාරීත්වය පිළිබඳ තත්ත්වය සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බව,

(ආ) සපයන ලද අරමුදල් ඒවා සපයනු ලැබූ කාර්යයන් සඳහා උපයෝජනය කර තිබුණු බව,

(ඇ) මාගේ පෙර වර්ෂයේ විගණන වාර්තාවෙන් පෙන්වා දෙන ලද කරුණු නිවැරදි කර ගැනීමට කළමනාකරණය විසින් සතුටුදායක පියවර ගෙන තිබුණු බව, සහ

(ඈ) ණය ගිවිසුමේ දක්වා ඇති මූල්‍ය සම්මුතීන්වලට අනුකූල වූ බවත්ය.

2.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම්

------------------------------------------

2.2.1 ගිණුම්කරණ අඩුපාඩු

--------------------------

මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන රු. 42,000,000 ක්වූ වියදම 2014 වර්ෂය සඳහා ඉදිරිපත් කරන ලද විසර්ජන ගිණුමේ දැක්වෙන රු. 41,472,008 ක්වූ අනුරූපී මුදල සමඟ එකඟ නොවූ අතර ඒ අනුව රු. 527,992 ක වෙනසක් දැක්වුනි.

3. මූල්‍ය හා භෞතික කාර්යසාධනය

-------------------------------------

3.1 අරමුදල් උපයෝජනය

----------------------------

මූල්‍යායනය, සමාලෝචිත වර්ෂය සඳහා අයවැයගත ප්‍රතිපාදනය හා සමාලෝචිත වර්ෂය තුළ සහ 2014 දෙසැම්බර් 31 දක්වා අරමුදල් උපයෝජනය පිළිබඳ වැදගත් සංඛ්‍යා ලේඛන කිහිපයක් පහත දැක්වේ.

| ප්‍රභවය | ණය ගිවිසුමේ මූලායනය සඳහා එකඟ වූ මුදල | | සමාලෝචිත වර්ෂය සඳහා අයවැය ඇස්තමේන්තුවේ කරන ලද වෙන් කිරීම | උපයෝජනය කළ අරමුදල් | | | |
|---|---|---|---|---|---|---|---|
| | | | | සමාලෝචිත වර්ෂය තුළ | | 2014 දෙසැම්බර් 31 දිනට | |
| | එ.ජ.ඩො මිලියන | රු.මිලියන | රු.මිලියන | එ.ජ.ඩො මිලියන | රු.මිලියන | එ.ජ.ඩො මිලියන | රු.මිලියන |
| ප්‍රදාන නියෝජිතායතනය (ආර්ථික සංවර්ධන සහයෝගීතා අරමුදල) | 40.00 | 4,501.20 | 2,004.0 | 15.02 | 2,003.90 | 33.35 | 4,448.99 |
| ශ්‍රී ලං ර | 9.92 | 1,116.86 | 103.2 | 0.31 | 42.00 | 1.18 | 158.15 |
| එකතුව | 49.92 | 5,618.06 | 2,107.2 | 15.33 | 2,045.90 | 34.53 | 4,607.14 |

3.2 භෞතික ප්‍රගතිය

ව්‍යාපෘතිය විසින් 2014 දෙසැම්බර් 31 දිනට සිදුකරන ලද මාර්ග පුනරුත්ථාපන වැඩ සහ වෙනත් ඉදිකිරීම් වැඩ පිළිබඳ භෞතික ප්‍රගතිය පහත දැක්වේ.

| | කාර්යය | නිමකිරීමට අපේක්ෂිත දිනය | 2014 දෙසැම්බර් 31 දිනට භෞතික ප්‍රගතිය (%) | |
|---|---|---|---|---|
| | | | ඉලක්කය | තථ්‍ය |
| (i) | හැටන් සිට නුවරඑළිය දක්වා මාර්ගය ඉදිකිරීම | 2015 මාර්තු 02 | 94.98 | 95.88 |
| (ii) | කොටගල උමං මාර්ගය | 2015 මාර්තු 15 | 90.20 | 72.36 |
| (iii) | නානු ඔය යටින් දිවෙන මාර්ගය (නුවරඑළිය) | 2015 පෙබරවාරි 28 | 92.10 | 89.59 |

3.3 කොන්ත්‍රාත් පරිපාලනය

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) ඩයගම මාර්ගයේ ලිඳුල මංසන්ධියේ මීටර් 200 ක් ඇස්පල්ට් මතුපිට ස්ථරය (asphalt wearing course) ඇතිරීම මඟින් වැඩිදියුණු කර තිබූ අතර රු.2,828,220 ක මුදලක් වැය කර තිබුණි. කෙසේ වුවද මෙම කාර්යය ව්‍යාපෘතියේ විෂය පථයට අදාළ නොවූ අතර අදාළ පාර්ශවයන්ගෙන් මේ සඳහා අනුමැතිය ලබාගෙන නොතිබුණි.

(ආ) වෙළුම 3 හි 13.4 ඡේදයේ තාක්ෂණික පිරිවිතරයන් අනුව, කොන්ත්‍රාත්කරු ආරක්ෂක පෙර සූදානම් සඳහා හා සතුටුදායක ප්‍රවාහන පාලන සැලසුම් සඳහා අනුකූල විය යුතු නමුත් වැඩ ක්‍රියාත්මක කිරීමේදී එම අවශ්‍යතාවයන්ට කොන්ත්‍රාත්කරු අනුකූල වී නොතිබුණි. මාර්ග සලකුණු ප්‍රතිදීපන පුවරු 5 ක් හැර යෝජිත මාර්ග සංකේත හා

මාර්ගය මත රේඛා ලකුණු කිරීම් කොටගල උමං මාර්ගයට සපයා නොතිබූ බව නිරීක්ෂණය විය.

තවද රදැල්ල කෙටි පිවිසුම් මාර්ගයේ අනතුරු අඩුකිරීම සඳහා අනතුරු දැන්වීම් පුවරු ප්‍රමාණවත්ව සවිකර නොතිබූ බව නිරීක්ෂණය විය.

(ඇ) 2015 ජුලි 14 දින වැඩබිම් පරීක්ෂාවේදී කිලෝමීටර් 0+460 හි පාලම අසළ අඩිපාර සකස් කිරීම, හානි වූ “ W ” බීම් නිවැරදි කිරීම, බෝක්කු ආවාටය පිරිසිදු කිරීම, බෝක්කු බිත්ති නැවත සකස් කිරීම, ගලායාම් දොරටුව (inlet) ඉදිකිරීම ආදී සම්පූර්ණ නොකළ වැඩ සහ හානිවීම් නිරීක්ෂණය විය.

3.4 නිෂ්කාර්ය වත්කම්

----------------------

කොටගල උමං මාර්ගය සඳහා රු.මිලියන 2.1 ක් වටිනා යොදා නොගත් ලැටිස් ආරුක්කු 4 ක්, කිසිදු ආරක්ෂක වැඩපිළිවෙලක් නොමැතිව මාර්ග සංවර්ධන අධිකාරියේ විධායක ඉංජිනේරු කාර්යාලයේ නිෂ්කාර්යව පැවතුණි.